ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2014/03/31 |

## 2014 මාර්තු මාසයේ දී උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/2007=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, වාර්ෂික සාමාන්‍ය පදනම මත, 2014 පෙබරවාරි මස පැවති සියයට 6.0 හි සිට 2014 මාර්තු මාසයේ දී සියයට 5.7 දක්වා තවදුරටත් පහළ ගියේය. මෙම පහළ යාමේ උපනතිය 2013 ජූනි මාසයේ සිට අඛණ්ඩව දක්නට ලැබිණි. මේ අතර, 2013 මාර්තු මාසයේ දී ලක්ෂ්‍යාමය පදනම මත උද්ධමනය පූර්ව මාසයේ වාර්තා කළ අනුපාතය වූ සියයට 4.2 හි ම නොවෙනස්ව පැවතිණි.



ආහාර නොවන කාණ්ඩයේ අයිතමයන්හි මිල ගණන් සුළු වශයෙන් ඉහළ යාම 2014 මාර්තු මාසයේ දී උද්ධමනය පහළ මට්ටමක පැවතීමට ප්‍රධාන වශයෙන් හේතු විය. නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තුව; ප්‍රවාහන; සහ සන්නිවේදන යන උප කාණ්ඩයන්හි මිල ගණන් මාසය තුළ නොවෙනස්ව පැවතිණි. කෙසේ වුවද, විවිධ භාණ්ඩ හා සේවාවන් (සියයට 0.8); රෙදිපිළි හා පාවහන් (සියයට 0.1); සෞඛ්‍ය (සියයට 0.1); විනෝදාත්මක හා සංස්කෘතික (සියයට 0.1); සහ අධ්‍යාපන (සියයට 0.1) යන උප කාණ්ඩයන්හි මිල ගණන් සුළු වශයෙන් ඉහළ ගියේය.

පෙර මාසයට සාපේක්ෂව 2014 මාර්තු මාසයේ දී සියයට 0.1 කින් පමණක් ඉහළ නැගුණු ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩය කො.පා.මි. දර්ශකයේ සියයට 0.1 ක් වූ මාසික ඉහළ යාම සඳහා ප්‍රධාන දායකයා විය. ආහාර කාණ්ඩය තුළ රතු ළූණු, ලොකු ළූණු, අර්තාපල්, බොහෝ එළවළු වර්ග සහ නැවුම් මත්ස්‍ය වර්ගවල මිල ගණන්හි පහළ යාමක් වාර්තා විය. කෙසේ වුවද, කිරිපිටි, තේ, බිත්තර, චීස්, බටර්, මාගරින්, සමහර පළතුරු වර්ග සහ අමු මිරිස් ආදියෙහි මිල ගණන්වල ඉහළ යාමක් වාර්තා විය.

ඉල්ලුමෙන් හටගන්නා උද්ධමනකාරී පීඩනයන් ඉතා හොඳින් පාලනය වී ඇති බව පිළිබිඹු කරමින් 2013 ජූනි මස සිට තීව්‍ර ලෙස අඩු වෙමින් පවතින වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය පූර්ව මාසයේ පැවති සියයට 3.8 හි සිට 2014 මාර්තු මාසයේ දී සියයට 3.5 ක් දක්වා ළඟා විය. ලක්ෂ්‍යාමය මූලික උද්ධමනය 2014 පෙබරවාරි මස වාර්තා කළ සියයට 3.1 හි සිට සියයට 3.4 දක්වා ඉහළ ගියේය.